USAID
FROM THE AMERICAN PEOPLE

# අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට ඔබට කළ හැකි දේ

1. හොඳ අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් සඳහා සේවකයන්ගේ සහ අමුත්තන්ගේ දායකත්වය ලබාගන්න

2. ඔබේ ගෙවත්තට අවශ්‍යය කාබනික පොහොර නිපදවීමට කොම්පෝස්ට් බඳුනක් භාවිතා කරන්න




3. මුද්‍රණය හැකිතාක් දුරට අඩු කරන්න. මුද්‍රණය කළ යුතුම නම් කඩදාසියේ දෙපැත්තම මුද්‍රණය කිරීමට උනන්දු වන්න. නව කාට්රිජ් මිලදී ගැනීම වෙනුවට කාට්රිජ් තුලට තීන්ත නැවත පුරවන්න



4. ඔබේ බෑග් සහ ඇසුරුම් හැකි සෑමවිටම නැවත භාවිතා කරන්න

5. එක් වරක් පමණක් භාවිතා කළ හැකි භාණ්ඩ වෙනුවට නැවත භාවිතා කළ හැකි හෝ ස්වභාවිකව දිරාපත් කළ හැකි විකල්ප භාණ්ඩ සෑමවිටම තෝරාගන්න උනන්දු වන්න



6. ඔබේ සැපයුම් දාමය තිරසාර කරන්න. දේශීය සහ නැවත භාවිතා කළ හැකි නිෂ්පාදන හැකි සෑම විටම මිලදී ගන්න

7. කඩදාසි, කාඩ්බෝඩ්, වීදුරු, පිසින තෙල්, ටින් සහ විද්‍යුත් අපද්‍රව්‍ය වැනි ප්‍රතිචක්‍රීකරණය කළ හැකිදේ සුදුසු ප්‍රතිචක්‍රීකරණ පහසුකම් ඇති මධ්‍යස්ථාන වෙත යවන්න



ප්ලාස්ටික් ජල බෝතල් භාවිතය ඉවත් කිරීමෙන් පසු, ශ්‍රී ලංකාවේ ත්‍රාසජනක අත්දැකීම් සපයන කුඩා සංචාරක ව්‍යාපාරයක් මගින් ප්ලාස්ටික් බෝතල් 35,000 ක් පමණ පරිසරයට මුදා හැරීම වළක්වාගෙන ඇත.මෙය මසකට ප්ලාස්ටික් බෝතල් 145 කට සමාන වේ.

“අපගේ කාබනික අපද්‍රව්‍ය ඌරු කොටුවක් වෙත යොමු කිරීමෙන් අපද්‍රව්‍ය අවම කර තිරසාරභාවයට දායක වීමට අපි තීරණයක් ගෙන ඇත්තෙමු. මෙමගින් අපද්‍රව්‍ය කළමනාකරණය අපට පහසුවනවා පමණක් නොව, එය ප්‍රතිලාභදායක ප්‍රයත්නයක් ද වේ.”

~ ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාන සංචාරක ව්‍යාපාරකරුවෙක්